www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ පිටුබලය ලත්, ලෙබනනයට එරෙහි ඊස්රායල යුද්ධයේ සැබෑ අරමුනු

**The real aims of the US-backed Israeli war against Lebanon**

**කර්තෘ මන්ඩලයේ ප්‍රකාශනය**
**2006 ජුලි 21**

ගුවනින් බෝම්බ හෙලීමේ මිනීමරු ක්‍රියාවලිය මගින් සූදානම් කරනු ලැබූ, ලෙබනනයට එරෙහි ප්‍රහාරය, එහි දසවන දිනට එලඹෙන විට, ඊස්රායල් හමුදා පූර්න පරිමානයේ ආක්‍රමනයකට සූදානම් වෙමින් සිටින අතර, යුද්ධයේ දුර දිග යන අධිරාජ්‍යවාදී අරමුනු පැහැදිලි වෙමින් තිබේ.

එක්සත් ජනපදයේ පූර්න දේශපාලන, මූල්‍ය හා මිලිටරි පිටුබලය සහිතව, ලෙබනනය ඊස්රායලයේ වැයික්කියක් බවට පත් කිරීමට, සියොන්වාදී පාලන තන්ත්‍රය උත්සාහ කරයි. මෙම මිලිටරි ක්‍රියාන්විතය වනාහි ඇෆ්ගනිස්ථාන හා ඉරාක ආක්‍රමනයත් සමග ඇරඹී, මැද පෙරදිග හා මධ්‍යම ආසියාව තුල අධිරාජ්‍යවාදී භූ-දේශපාලනික ප්‍රතිව්‍යුහකරනයේ, ව්‍යාප්තිය හා දිග හැරීම යි. මුලු මහත් කලාපයේ ම එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටු වීම ඔවුන්ගේ අරමුනයි.

ලෙබනනය තුලින්, දේශපාලන හා මිලිටරි බලවේගයක් ලෙස හෙස්බුල්ලා සංවිධානය මුලිනුපුටා දැමීම මෙම යුද්ධයේ ක්ෂනික අරමුන වන අතර, එය රටේ, ඊස්රායලය හා ඇමරිකානු ආධිපත්‍යයට පවතින සියලු මහජන විරෝධතාවන්ට එරෙහිව මෙහෙයවයි. බුෂ් පාලනාධිකාරයේ හා ජෙරුසලමේ එහි සගයන් කරුනු දෙකක් සඳහා මෙය අවශ්‍ය ම පියවරක් ලෙස දකිති. එනම් 1. සිරියානු බාත්වාදී තන්ත්‍රය ඉවත් කිරීම. 2. ඉරානයට එරෙහිව පූර්න පරිමානයේ යුද්ධයන් දියත් කිරීම යි.

ලෙබනනයට පහර දීම, සොල්දාදුවන් දෙදෙනෙක් අල්ලා ගැනීම මගින් පොලඹවා ලූ "ආත්මාරක්ෂක" ක්‍රියාවක් බව, ඊස්රායල් ආන්ඩුව හා බුෂ් පරිපාලනය, ප්‍රචාරනය සඳහා නිමක් නැතිව යලි යලිත් කියා සිටියත්, මෙය දැනුවත් නිරීක්ෂකයන් අතර කිසිදු සුජාත භාවයක් අත් කර ගෙන නැත.

ලන්ඩනයේ *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පත, ජුලි 17 වන දින එහි ප්‍රධාන කතුවැකියෙහි ලියා ඇත්තේ " සැම විටම එසේ සිදු විය හැකි පරිදි, ලෙබනනයට ගොඩබිමින්, මුහුදින් හා ගුවනින් සිදු කරන දැවැන්ත ඊස්රායල් බෝම්බ හෙලීම්, පසු ගිය සතියේ හෙස්බුල්ලාවරුන් දේශ සීමාව හරහා සිදු කල කඩාවැදීමට ප්‍රතිචාරය ය යන්න දැන්, ඉස්ලාමීය ගරිල්ලන් විසින් අල්ලා ගත් ඊස්රායල සොල්දාදුවන් මුදා ගැනීමට බොහෝ වැඩි දෙයක් බවට පත්ව තිබේ" යනුවෙනි.

ඒ සමාන වූ තක්සේරු කිරීම් *වොෂින්ටන් පෝස්ට්* හා *වෝල්ස්ට්‍රීට් ජර්නල්* හි මෙන් ම බොහෝ පුවත්පත්වල ජාත්‍යන්තරව පල වී තිබුනි. ඔවුන් සරලව සඳහන් කරන්නේ මේ වන විට පැහැදිලි වී ඇති - ලෙබනනයේ ඊස්රායල ප්‍රහාරයන් ආක්‍රමනකාරී ක්‍රියාවක දිගු කාලීන සැලසුමක මල් පල ගැන්වීමක් ලෙසයි.

2005 පෙබරවාරියේ දී, කෝටිපති ලෙබනන් ජාතික හිටපු අගමැති රෆික් හරිරි ඝාතනය කිරීම, මෑත සිදුවීම් විසින් පැහැදිලි ඉදිරි දර්ශනයකට ගෙනැවිත් තිබේ.

සිරියාවේ හිතවතෙකු වන ලෙබනනයේ ජනාධිපති එමිල් ලාහුඩ් සිය ධුර කාලය දීර්ඝ කර ගැනීමට ගත් තීරනයට එරෙහිව විරෝධය පෑමක් ලෙස අගමැති ධුරයෙන් ඉල්ලා අස් වී සිව් මසකට පසුව බේරූට්හිදී ඔහු ගමන් ගත් රිය පෙල විනාශ කල දැවැන්ත පිපිරීමකින් හරිරි ජීවිතක්ෂයට පත් විය. එක්සත් ජනපදය හා රටේ හිටපු විජිත පාලකයා වූ ප්‍රන්සය හරිරිගේ මරනය පිලිබඳව වහාම ඩැමැස්කස් වෙත වරද පැටවූහ. ලෙබනනය තුල, ප්‍රධාන කොට ම වඩාත් වරප්‍රසාදිත සමාජ ස්තරයන් මත පදනම් වූ ඔවුන්ගේ සගයන්, හරිරි ඝාතනය ඊනියා දේවදාර විප්ලවය දියත් කිරීමට අවස්ථාව කොට ගත් අතර, එහි ප්‍රතිපලය වසයෙන්, 1970 ගනන්වල පටන් ලෙබනනයෙහි රැඳී සිටි සිරියානු හමුදාවන් ඉවත් කරනු ලැබිනි.

සැබැවින්ම සිරියානු තන්ත්‍රය ඝාතනය පිටුපස සිටියේ නම්, ඔවුන් එය සිදු කලේ, දුගී ෂියා ජනතාව අතර පුලුල් සහයෝගයක් ලබන, දකුනු ලෙබනනයේ ආධිපත්‍යය දරා සිටික හෙස්බුල්ලා ව්‍යාපාරයට එරෙහි ප්‍රහාරය සූදානම් කිරීම සඳහා, සිරියාව ලෙබනනයෙන් පිට මං කිරීමේ එක්සත් ජනපද ඊස්රායල් සැලැස්මට හරිරි සිය සහයෝගය දෙනු ඇති බව, ඔවුන් ඒත්තු ගෙන සිටීම නිසා ය. ඉන් පසු ඩැමැස්කස් හි බාත් තන්ත්‍රයට එරෙහිව ම ප්‍රහාරයක් එල්ල වනු ඇතැයි ඔවුන් හොඳින් ම දැන සිටියහ.

අනෙක් අතට එම සැලැස්ම ක්‍රියාවට නැගීම සඳහා නිමිත්තක් නිර්මානය කර ගැනීමේ කටයුත්ත සඳහා මෙය, ඊශ්‍රායල හෝ ඇමරිකානු ඔත්තු සේවා ආයතන මගින් සංවිධානය කල ප්‍රකෝපකාරිත්වයක් වීමට ද හොඳට ම ඉඩ ඇත.

එම කාරනා දෙකෙන් කොයික වුවත්, වර්තමාන ඊශ්‍රායල ප්‍රහාරය හරියටම එවන් ක්‍රියාන්විතයක් භාවිතයට නැගීමකි. දේවදාර විප්ලවය මගින් ම, ඊශ්‍රායල් හා ඇමරිකානුවන් ගේ ඇස් ඉදිරිපිටට ගෙන ආවේ බලාපොරොත්තු සුන් වූ ප්‍රතිඵල ය. වොෂින්ටනයේ හා පැරිසියේ සම අනුග්‍රහයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය සම්මත කල යෝජනා කොන්දේසි යටතේ සිරියාව, ලෙබනනයෙන් සිය හමුදාවන් ඉවත් කර ගැනීමට බැඳී සිටියේ ය. කෙසේ වුව ද එහි හෙස්බුල්ලා සගයා නිරුපද්‍රිතව සිටියේ ය.

සැබැවින්ම, මැරොන්වාදී ක්‍රිස්තියානි බලවේගයන් හා වොෂින්ටනය සමග සහයෝගී වූ අනෙකුත් පක්ෂ විසින් සංවිධානය කල, හොඳින් ප්‍රචාරය ලබා දුන් බේරුට්හි පැවැත් වූ පෙලපාලි මගින්, සිරියානු විරෝධී උද්ඝෝෂනයේ මුදුන සලකුනු කල අතර, ඊට ප්‍රතිවිරුද්ධව හෙස්බුල්ලාවරුන් සංවිධානය කල වඩාත් විශාල පෙලපාලිවලට ලක්ෂ ගනන් දෙනා බේරුට් හි වීදිවලට ඇදී ආහ. දේවදාර විප්ලවයෙන් පැන නැගුනු ආන්ඩුවට, නව සිවිල් යුද්ධයක හෙවනැල්ල හමුවේ, හෙස්බුල්ලා නියෝජිතයන් ද කැබිනෙට්ටුවට ඇතුලත් කර ගැනීම මගින් විසඳුමක් ඇති කර ගැනීමට බල කෙරී ඇතැයි හැඟී ගියේ ය.

ජුලි 20 වන දින *නිව් යෝර්ක් ටයිම්ස්* හි පල වූ ලිපිය ක බුෂ් පාලනාධිකාරයේ හා ඇමරිකානු පාලක කවයන් ඇතුලත පැවති අපේක්ෂා භංගත්වය පිලිබිඹු කරයි. "දශක තුනකට ආසන්න කාලයක් පැවති සිරියානු පාලනය අවසන් කල, ඊනියා දේවදාර විප්ලවයෙන් නැංවූ බලාපොරොත්තු මධ්‍යයේ ම, ආගම මගින් බෙදා වෙන් කල දේශපාලන සංස්ථාවන්ගේ පද්ධතියක, කන්ඩායම්ක හිර කබායක් තුල ආන්ඩුව හිර වී සිටියි." (එක් ආගමකට අයත් නියෝජිතයන් වෙත දේශපාලන බලය පවරාගෙන ඇතුවා පමනක් නොව එය, "යුදෙව් රාජ්‍යයක්" ලෙස ද හඳුන්වනු ලබන ලෙබනනයට දකුනු දෙසින් පිහිටි අසල්වැසියාගේ "කන්ඩායම්ක හිර කබාය" ගැන ටයිම්ස් පත්‍රයට එවන් විරෝධයක් ඇත්තේ නැත.)

ලෙබනන් ජනතාවට එරෙහි වර්තමාන ප්‍රහාරයේ සැබෑ හේතුව, මෙම ප්‍රකාශය මගින් පෙන්නුම් කරයි. ෂියාවරුන් අතර ඇති, දැඩි ලෙස පලස්තීනුවන්ට පක්ෂපාතී හා ඊශ්‍රායල් විරෝධී මනෝ ගතීන් කුඩු කර දමා, එක්සත් ජනපද හිතවාදී - සියල්ලටත් වඩා ක්‍රිස්තියානි ෆැලැන්ජිවරු - දක්ෂිනාංශිකයන්ගේ බලය බෙහෙවින් තර කරන ගැඹුරු දේශපාලන ප්‍රති ව්‍යුහකරනයක් රට තුල ඇති කිරීම එහි අරමුන යි.

මෙය, 1975 සිට 1990 දක්වා ඇවිල ගිය ලෙබනන් සිවිල් යුද්ධයේ ප්‍රතිඵල ආපසු හැරවීමට ගත් උත්සාහයකි. එක්සත් ජනපදය හා අනෙකුත් අධිරාජ්‍යවාදී බලවතුන්, විශේෂයෙන් ම ප්‍රන්සය, දීර්ඝ හා බිහිසුනු ගැටුම අවුලුවා පවත්වා ගෙන යාමේ දී ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කලහ. එයට ඇමරිකානු හා ප්‍රන්ස හමුදාව මැදිහත් කිරීම ද, 1982 ඊශ්‍රායල් ආක්‍රමනය හා ඉන් පසුව දකුනු ප්‍රදේශය 18 වසරක ඊශ්‍රායල් ආධිපත්‍යයට යටත් කිරීමත් ඇතුලත් විය. පලස්තීන විමුක්ති සංවිධානයේ හා ලෙබනන් වාමාංශයේ සන්ධානයට එරෙහිව පෙල ගැසුනු දක්ෂිනාංශික බලවේගයන්ගේ හවුලට නායකත්වය දුන් ෆැසිස්ට්වාදී ෆැලැන්ජිවරු, වොෂින්ටනයේ ප්‍රධාන සගයා විය.

අධිරාජ්‍යවාදී මැදිහත්වීම හා කුමන්ත්‍රනය පලස්තීන විමුක්ති සංවිධානය (පීඑල්ඕ) ලෙබනනයෙන් පිටමං කිරීමට සමත් වුවත්, එක් අතකින් අවසන් විසඳුමෙන් ෆැලැන්ජිවරුන්ගේ බලය සීමා වූ අතර, අනෙක් අතින්, ඉරානයේ හා සිරියාවේ පිටුබලය ලත් හෙස්බුල්ලාවරුන්ගේ නැගී ඒමක් දැක ගත හැකි විය. 1983 ඔක්තෝබරයේ දී බීරුට්හි එක්සත් ජනපද මැරීන් හමුදා කඳවුරට බෝම්බ ප්‍රහාර එල්ල වීමෙන් පසුව, හමුදා ඉවත් කර ගැනීමේ තැන් පටන් ප්‍රථම වතාවට, ලෙබනනයට හමුදාව යලි ගෙන ඒමට, වර්තමාන ඊශ්‍රායල් ආක්‍රමනයෙන් එක්සත් ජනපදයට අවස්ථාව සැලසී තිබීම වැදගත් ය.

## ඓතිහාසික පසුබිම

ලෙබනනය පරිපූර්න ඊශ්‍රායල් වැයික්කියක් බවට පත් කර ගැනීමේ දී, මිලිටරි බලපෑම හා එරටෙහි දක්ෂිනාංශික බලවේගයන් සමග දේශපාලන සන්ධානයන් යොදා ගැනීමේ, දිගු ඉතිහාසයක් ඊශ්‍රායලය සතු ය. ලෙබනන් සිවිල් යුද්ධය මැද, 1978 මාර්තුවේ ඊශ්‍රායලය දේශසීමා හරහා ලෙබනනය තුලට හමුදාව මැදිහත් කිරීමේ දී සිය ක්‍රියාවන් යුක්තිසහගත කලේ එය පීඑල්ඕවේ ත්‍රස්තවාදී කටයුතුවලට ප්‍රතිචාර දැක්වීමක් බව බව කියා සිටිමිනි. ඊශ්‍රායල් මිලිටරි ක්‍රියාන්විතයේ ප්‍රතිඵලය ලෙස ලෙබනන් වාසීන් 2000කට වැඩි සංඛ්‍යාවක් ඝාතනය වීමෙන් පසුව, ජාත්‍යන්තර බලපෑම හමුවේ ඉවත් වීමට බල කෙරුනු නමුත්, මේජර් සාඩ් හඩාඩ් නමැත්තාගේ නායකත්වය යටතේ, දකුනු ලෙබනන් හමුදාව ලෙස හඳුන්වා ගත්, දක්ෂිනාංශික සන්නද්ධ කන්ඩායම්වල අනුග්‍රහය යටතේ ඊශ්‍රායලය, එහි උතුරු සීමාවේ සැතපුම් 12ක බිම් කඩක පාලනය ගෙන ගියේ ය.

සිව් වසරකට පසුව 1982 දී, ඊශ්‍රායල අගමැති මෙනචම් බෙගින් හා ඔහුගේ ආරක්ෂක ඇමති ඒරියල් ෂැරොන්, පීඑල්ඕව රටින් නෙරපීමටත් ලෙබනනයේ දේශපාලන බලය සියතට ගැනීමටත්, තවත් දුර යන

අභිලාෂී සැලැස්මක් දියත් කලේ ය. 1982 ජූනි මස පලස්තීන ඝාතකයෙකු විසින් ලන්ඩන්හි දී ඊශ්‍රායල් තානාපතිට තුවාල සිදු කල විට, යලිදු වතාවක් එය හොඳ නිමිත්තක් බවට පත් කර ගත්තේ ය. මෙම සිද්ධියට පීඑල්ඕව කිසිදු අයුරකින් සම්බන්ධ නැති බව, ඔත්තු සේවා විශේෂඥයින් පිලිගත් නමුදු, ලෙබනනය ආක්‍රමනය කිරීමට නිමිත්තක් ලෙස බෙගින් ආන්ඩුව මෙය යොදාගත්තේ ය. පූර්න නරුමත්වයකින් යුක්තව "ගැලිලියේ සාමය"යයි නම් කල මෙහෙයුමක දී ඊශ්‍රායල් හමුදා, උතුරෙන්, අඛන්ඩ බෝම්බ ප්‍රහාරයට ලක් කල බේරූට් නගරය ආසන්නයට ගමන් ගත්තේ ය.

යුද්ධය, ලෙබනනයෙන් පීඑල්ඕව, පිටුවහල් කිරීමට බල කල අතර ඊශ්‍රායලයේ සහාය ලැබූ ලෙබනනයේ ෆැසිස්ට් සන්නද්ධ භටයන් ලවා, පලස්තීන සරනාගතයන් දහස් ගනනක් ඝාතනය කිරීමට තුඩු දුන්නේ ය.

රේගන් පරිපාලනය බේරූට්හි මැරීන් හමුදා රැඳවීමත් සමග එක්සත් ජනපදය ද ලෙබනනය ද ලෙබනනය යටත් කිරීම සඳහා මැදිහත් විය. එහෙත්, අමරිකානු නාවික යාත්‍රාවල සිට ෂෙල්වෙඩි දැමීම මගින් බේරූට් අවට දුගී ප්‍රදේශවලට ප්‍රහාර එල්ල කිරීමට එක්සත් ජනපදයේ ඍජු මැදිහත් වීම, ගැඹුරු සතුරුකම් නිර්මානය කල අතර, මැරීන් භටයන් 250කට ආසන්න සංඛ්‍යාවකට මරු කැඳවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයට මං පෑදී ය. රේගන් පරිපාලනය එහි පාඩුව කපා ගෙන ලෙබනනයෙන් ඉවත් වීමට තීරනය කලේ ය.

කෙසේ වුව ද ඊශ්‍රායල් තන්ත්‍රය, දකුනු ලෙබනනයේ සැලකිය යුතු පංගුවක පාලනය පවත්වා ගෙන යාමට මාන බැලී ය. හෙස්බුල්ලාවරු බලගතු දේශපාලන හා මිලිටරි බලවේගයක් ලෙස නැගී ආවේ යටත් කිරීමට එරෙහි විරෝධය තුලිනි. හෙස්බුල්ලාවරු ගෙන ගිය ගරිල්ලා යුද්ධය මගින් වසර 2000 වන විට, ඊශ්‍රායලයට මුලුමනින් ම ඉවත්ව යෑමට බල කෙරුනි.

## ඊශ්‍රායලයේ මිලිටරි ක්‍රමෝපායන්

වර්තමාන යුද්ධය, හෙස්බුල්ලාවරු අතුගා දැමීම පමනක් නොව, ලෙබනනය තුල එක්සත් ජනපද හා ඊශ්‍රායල ආධිපත්‍යයට එරෙහි ඕනෑ ම විරෝධයක් විනාශ කර දැමීම අරමුනු කර ගෙන ඇත. භාවිතයට යොදාගෙන ඇති මාධ්‍යයන් පැහැදිලි කිරීම සඳහා මොවුන්ගේ සිතැඟියාවන් බොහෝ දුරකට ඉවහල් වේ. ඊශ්‍රායලය, දුගී ෂියා ජනතාව වෙසෙන හා හෙස්බුල්ලාවරුන්ගේ ප්‍රධාන සහයෝගිතා පදනම වන දකුනු දිග ලෙබනනයට, වගවිභාගයකින් තොරව බෝම්බ හෙලමින් සිටියි. ඊශ්‍රායල් මිලිටරිය හිතාමතා ම මුලුමහත් සිවිල් ජනතාව ම ඉලක්ක කරගන්නා අතර, ගම් බිම එහැමපිටින් ම විනාශ කරමින් මුලු කලාපය ම ජනශූන්‍ය ප්‍රදේශයක් බවට පත් කරති.

වොෂින්ටන් පෝස්ට් පුවත්පත බ්‍රහස්පතින්දා වාර්තා කලේ, ලිටානි ගංගාවෙන් පහල කොටසේ ජීවත්වන සියලු වැසියන් පැය 24ක් තුල ප්‍රදේශයෙන් ඉවත් විය යුතු යයි ඊශ්‍රායලය නියෝග කර ඇති බවයි.

මෙහි අරමුන, දකුනු ලෙබනනය මිනිසුන් පය නොගසන භූමියක් බවට පත් කර, ඊශ්‍රායල හමුදාවන්ට හෝ ඊශ්‍රායල් හා ඇමරිකානු ඒකාබද්ධ හමුදාවන්ට ඇතුල්වීම සඳහා පසුබිම සකස් කිරීමයි. සමහර විට මෙයට, එක්සත් ජාතීන් ගේ අනුමැතිය ලත් "ජාත්‍යන්තර සාම සාධක හමුදාවක්" ලෙස ක්‍රියා කරන අනෙකුත් ජාතික භට කන්ඩායම් ද ඇතුලත් විය හැකි ය.

අන් සියල්ලටත් වඩා ඊශ්‍රායල් ප්‍රහාරය, ලෙබනනයේ දුගී ජනතාවට එරෙහි යුද්ධයකි. බේරූට් හි වඩාත් වරප්‍රසාදිත නිවස්න ප්‍රදේශ හා රටේ අනෙකුත් කොටස් බොහෝ දුරට ප්‍රහාරයට ඉලක්ක වී නැත. මෙය, ෂියා, හා පලස්තීන සරනාගත ජනතාවන්ට එරෙහිව ෆැලැන්ජිවරුන් සමග සහයෝගී වූ සිවිල් යුද්ධ කාල පරිච්ඡේදයේ එක්සත් ජනපද හා ඊශ්‍රායල් ප්‍රතිපත්තියට ම අනුකූල වන්නකි.

දකුනු ලෙබනනයට එරෙහිව මරනය හා විනාශය ගෙන ඒමේ මෙම ව්‍යායාමය, දකුනු දිග බේරූට්හි ෂියා මධ්‍යස්ථානවලටත්, රටේ අවශේෂ ප්‍රදේශවල ගුවන් තොටුපලවලටත්, වරායන්, මාර්ග, පාලම්, විදුලිබල මධ්‍යස්ථාන එල්ල කර බෝම්බ දැමීම සමග එකට බැඳී ඇත. අරමුන වී ඇත්තේ රටේ යටිතල ව්‍යුහය බිඳ දැමීම යි. ලෙබනනය දේශපාලනිකව යලි සැකසීමට නම් පලමුව එය දුගීභාවයට ඇද හෙලිය යුතු ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය හා එහි ද්විතීයික සහකරු වන ඊශ්‍රායලය, සිරියාවේ, ඉරානයේ හා ඉන් ඔබ්බට මහ ජනතාව සඳහා තබා ගෙන ඇත්තේ කුමක් ද යන්න ගැන මින් යම් අදහසක් ලබා දෙයි.

පූර්න පරිමානයේ ගොඩබිම් ආක්‍රමනයක් සඳහා සැලසුම් ඊශ්‍රායලය සතුව නැතැයි විශ්වාස කිරීමට කිසිදු හේතුවක් නැත. ඊශ්‍රායල් නායකයන් එවැන්නක් අදාල නැතැයි කියන තරමට ම එය වඩාත් විය හැකි දෙයක් බවට පත් වෙයි. දකුනු ලෙබනනයට බෝම්බ හෙලීමේ පරිමානය, දහස් ගනන් ජනතාව මරා දැමීමට සෑහෙන්නේ වී නමුත්, දේශපාලන හා මිලිටරි බලවේගයක් ලෙස හෙස්බුල්ලාවරුන් විනාශ කර දැමීමේ හා ලෙබනනය සියොන්වාදීන්ගේ වැයික්කියක් බවට පත් කිරීමේ ඊශ්‍රායල් අරමුනු එයින් මුදුන් පත් නොවනු ඇත.

ඊශ්‍රායලයේ හාරෙට්ස් පුවත්පත උපුටා දක්වමින් එන්බීසී ගුවන් විදුලියේ බ්‍රහස්පතික්දා සවස වැඩ සටහනක් වාර්තා කලේ, දහස් ගනනක ඊශ්‍රායල් හමුදා, දේශ සීමාව හරහා දකුනු ලෙබනනයට ඇතුල් වීමට පටන් ගෙන ඇති බවයි.

## එක්සත් ජනපදයේ ක්‍රියා කලාපය

යුද්ධයේ දී එක්සත් ජනපදය තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉෂ්ඨ කරයි. එය යුද්ධයට පූර්න අනුමැතිය ලබා දී ඇති අතර, යුද්ධය කර ගෙන යාමේ දී එක්සත් ජනපදයේ නිෂ්පාදිත හා ඇමරිකානු මුදලින් පවත්වා ගෙන යන, ඊස්රායල් මිලිටරියේ යුද යාන්ත්‍රනය සමග සමීපතම සම්බන්ධතාවක් සහිතව වැඩ කරයි.

රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ දී බුෂ් පරිපාලනය, සිය කටයුතු, ඊස්රායලයේ මිලිටරි අරමුනු හා දේශපාලන ගනන් බැලීම් සමග විවෘතව ම පෙලගස්වා ඇත. දකුනු ලෙබනනයට කල හැකි ඉහල ම විනාශය සිදු කිරීම සඳහා ඊස්රායල මිලිටරියට, ඇති තරම් කල් ලබා දීම සඳහා වොෂින්ටනය, කලාපය වෙත ලඟදී ම සිදුවන එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස්ගේ සංචාරය, ඊස්රායලය සමග සම්බන්ධීකරනය කරයි. ජුලි 19 වන දින, *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය වාර්තා කල පරිදි, "හෙස්බුල්ලා බලවේගයන් දුබල කිරීම සඳහා ඊස්රායලයට තවත් කල් ලබා දීමේ පැත්තෙන්, ගැටුමට අත පෙවීමට පෙර රයිස් මහත්මිය, අඩුම තරමින් තවත් දින කිහිපයක් ප්‍රමාදවනු ඇත."

සටන් විරාමයට විවෘතව විරෝධය පෑම පිලිබඳව, එක්සත් ජනපද ආන්ඩුවට පූර්වාදර්ශයක් නොමැත. ජුලි 19 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නල්*හි පල වූ තරමක් අවංක ඇගැයීමක් තුල, ඊස්රායලය හා හෙස්බුල්ලාවරුන් අතර පැන නැගි අවසාන් ප්‍රධාන ගැටුම අවස්ථාවේ වොෂින්ටනයේ රාජ්‍යතන්ත්‍රික ක්‍රියා කලාපය ගැන සිහිපත් කරමින් මෙසේ සඳහන් කරයි.

"දස වසරකට පෙර හෙස්බුල්ලාවරුන් හා ඊස්රායල හමුදා සති ගනනක් තිස්සේ ලේ ස්නානයක යෙදී සිටිය දී, ජනාධිපති ක්ලින්ටන්, රාජ්‍ය ලේකම් වොරන් ක්‍රිස්ටෝපර් කලාපය වෙත පිටත් කර හැරි අතර, ඔහු දින හයක් පුරා ෂටලයක් මෙන් ජෙරුසලම හා ඩැමස්කස් අතර දැඩි රාජ්‍යතාන්ත්‍රික මෙහෙවරක යෙදුනි. අවසානයේ දී ඔහුට, අඩු ගනනේ තාවකාලික හෝ සටන් විරාම ගිවිසුමක් ඇති කර ගැනීම මගින් ගැටුම් අවසන් කිරීමට හැකි විය.

"අද බුෂ් පරිපාලනයට ඇත්තේ සහමුලින් ම වෙනස් වූ ප්‍රවිශ්ටයකි."

එක්සත් ජනපදය, විදේශ පිලිවෙත සම්බන්ධයෙන් උපකරනයක් ලෙස යුද්ධය, මුලුමනින් ම හා විවෘතව යුක්තිසහගත කරයි. මෙය, ඉරාකය තුල එහි මිලිටරි ආක්‍රමනය පවත්වා ගෙන යෑම වන අතර, ඉරානය, සිරියාව හා අනෙකුත් රටවලට එරෙහි අනාගත ආක්‍රමනයේ බලාපොරොත්තුව ද වෙයි. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ දෙක ද, සමස්ත ඇමරිකානු  දේශපාලන සංස්ථාපිතය ද විසින් වැලඳ ගෙන ඇති "පූර්වභංග යුද්ධයේ" බුෂ් ධර්මතාව සමග එය බැඳී ඇත.

ලෙබනන්හි ඝාතනය කර ගෙන යාමට ඊස්රායලයට ඉඩ හැරීමේ වොෂින්ටන් අධිරාජ්‍යශීලී උත්සාහය සලකුනු කරන්නේ, වර්තමාන යුද්ධය මැදපෙරදිග පුරා ඇමරිකානු ආධිපත්‍ය ඕනෑ ම හා සියලු මාධ්‍යයන් මගින් පිහිටුවා ලීමේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදී ධාවනයේ කොටසක් වන බවයි.

මෙම නොසැලකිලිමත් හා සාපරාධී මිලිටරි මදාවිය කෙටිකාලයේ දී තව දුරටත් මෙම අරමුන ඔස්සේ යනවා ද නැත්නම් කලාපය තුල වොෂින්ටනය වඩාත් ගැඹුරු මරාලයකට මෙහෙයවෙනවා ද යන්න ඉදිරියේ දී දැක ගත හැකි ය.

© www.wsws.org